# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2015/57 - 2017 අප්‍රේල් මස 21 වැනි සිකුරාදා - 2017.04.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : MOR/LAN/01/F1/186.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2009/VE/154.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඟුලාන (මොරටුව මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 520212/05/02 දරන 2016.09.30 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 513 සහ 514 සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0347ක් වූ ඉඩම් කොටස් වේ.

**කැබලි අංක 513**

ඉඩමේ නම: නැත; ඉඩමේ විස්තරය: පාර; හිමිකම් කියන්නා : රජය; මුල් හිමිකම් පාන්නා: අඟුලාන සමුද්‍රාසන්න පාරේ අංක 334 හි පදිංචි වැලිගමගේ කීර්තිපාල සිල්වා; ප්‍රමාණය: හෙක්. 0.0122.

**කැබලි අංක 514**

ඉඩමේ නම: මාදන්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා : රජය; මුල් හිමිකම් පාන්නා: අඟුලාන සමුද්‍රාසන්න පාරේ අංක 334 හි පදිංචි වැලිගමගේ කීර්තිපාල සිල්වා; ප්‍රමාණය: හෙක්. 0.0225.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජුනි මස 28 වැනි දින පෙ. ව. 09.30ට මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017.06.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ ලියකියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

එච්. ආර්. එච්. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මොරටුව.

2017 අප්‍රේල් මස 19 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05– 174


1A - G 25451 - 22 (2017/04)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.